# ලංසු සඳහා ආරාධනයයි
## දික්වැල්ල ප්‍රාදේශීය සභාව - දික්වැල්ල

දික්වැල්ල ප්‍රාදේශීය සභාවේ සභාපති වන මා විසින් සුදුසුකම්ලත් හා නිපුණතා පූර්ණ ලංසුකරුවන් වෙතින් පහත සඳහන් ව්‍යාපෘති සඳහා මුද්‍රා තැබූ ලංසු කැඳවනු ලැබේ.

| අනු අංකය | කොන්ත්‍රාත් අංකය | කොන්ත්‍රාත් නාමය | සෘජු ඉදිකිරීම් පිරිවැය (අවිනිශ්චිත හැර) රුපියල් මිලියන | කොන්ත්‍රාත් කාලය (දින) | CIDA ශ්‍රේණිය | ලංසු සුරක්ෂණය (රුපියල්) |
|---|---|---|---|---|---|---|
| 01 | DPS/DEV/02/01/2026 | පාතෙගම දකුණ සමඟි මාවත (උඩුපිටිය පාරේ සිද්ධාලේප නිවස අසලින්) සංවර්ධනය කිරීම. | 2.4 | 90 | C9/C8/C7 | 25,000.00 |
| 02 | DPS/DEV/02/10/2026 | බඹරැන්ද දකුණ බඹරැන්ද මැදපාර සංවර්ධනය කිරීම. | 2.1 | 90 | C9/C8/C7 | 21,000.00 |
| 03 | DPS/DEV/02/14/2026 | රන්නාවල මීගස්දෙනිය විදුහල් පිවිසුම් මාර්ගය සංවර්ධනය කිරීම. | 3.1 | 90 | C9/C8/C7 | 32,000.00 |
| 04 | DPS/DEV/02/17/2026 | දොඩම්පහල බටහිර පොල්පිටිය කාණුව හා මාර්ගය සංවර්ධනය කිරීම. | 2.8 | 90 | C9/C8/C7 | 28,000.00 |
| 05 | DPS/DEV/02/19/2026 | බතීගම බටහිර බෝදරවෙල්ල පැති බැම්ම ඉදිකිරීම. | 2.7 | 90 | C9/C8/C7 | 27,000.00 |
| 06 | DPS/DEV/02/20/2026 | බෙලිදෙනිය මාර්ගයේ ගොඩඋඩ වේල්ල කොටසේ දකුණු පස පැති බැම්ම සකස් කිරීම. | 2.2 | 90 | C9/C8/C7 | 22,000.00 |
| 07 | DPS/DEV/02/21/2026 | බඹරැන්ද මධ්‍යම කඳුරුප්පවෙල්ල පැති බැම්ම සකස් කිරීම | 3.6 | 90 | C9/C8/C7 | 36,000.00 |
| 08 | DPS/DEV/03/SPD/02/2026 | ලුණුකලපුව සමාධි අධ්‍යාපන ආයතනයට යන මාර්ගය සංවර්ධනය කිරීම. | 3.9 | 90 | C9/C8/C7 | 39,000.00 |
| 09 | DPS/DEV/03/SPD/03/2026 | වත්තේගම ගොඩවාන මාර්ගය සංවර්ධනය කිරීම. | 3.7 | 90 | C9/C8/C7 | 37,000.00 |
| 10 | DPS/DEV/03/SPD/05/2026 | ඝන අපද්‍රව්‍ය කළමනාකරණ මධ්‍යස්ථානයක් ඉදි කිරීම. | 7.3 | 90 | C8/C7/C6 | 73,000.00 |
| 11 | DPS/DEV/03/SPD/06/2026 | දොඩම්පහළ උතුර මාරගහවත්ත මාර්ගය සංවර්ධනය කිරීම. | 2.0 | 90 | C9/C8/C7 | 21,000.00 |
| 12 | DPS/DEV/03/DITVA/02/2026 | බෙලිවත්ත වසමේ පල්ලෙවත්ත බෝක්කුව සකස් කිරීම. | 2.0 | 90 | C9/C8/C7 | 21,000.00 |
| 13 | DPS/DEV/03/DITVA/04/2026 | දොඩම්පහළ උතුර දඹගස්ආර මාර්ගයේ කාණු පද්ධතිය සංවර්ධනය කිරීම. | 2.8 | 90 | C9/C8/C7 | 28,000.00 |

ලංසුපත් නිකුත් කිරීම - 2026.06.25 දින පෙ.ව.9.00 සිට 2026.07.08 දින ප.ව. 3.00 දක්වා (පෝරම ගාස්තුව රු.2,000.00)
ලංසුපත් භාර ගැනීම - 2026.06.26 දින පෙ.ව.9.00 සිට 2026.07.09 දින ප.ව. 2.00 දක්වා
ලංසුපත් විවෘත කිරීම - 2026.07.09 දින ප.ව. 2.00 ට දික්වැල්ල ප්‍රාදේශීය සභා කාර්යාලයේ දී.
විස්තර දැනගැනීම සඳහා - 0412255275 / https://dickwellaps.lk

රුවන් වික්‍රමආරච්චි,
සභාපති
දික්වැල්ල ප්‍රාදේශීය සභාව

<u>**ප්‍රසම්පාදන උපදෙස්/කොන්දේසි**</u>

1. ලංසු සඳහා ඉල්ලුම් කල යුත්තේ **<u>2026.06.25 දින පෙ.ව.9.00 සිට 2026.07.08 දින ප.ව.3.00 දක්වා (රාජකාරී දිනයන්හි දී)</u>** කාලය තුල නිකුත් කරනු ලබන ප්‍රසම්පාදන ආකෘති පත්‍ර මඟින් පමණක් වේ. ප්‍රසම්පාදන ආකෘති පත්‍ර නිකුත් කරනුයේ පෝරම ගාස්තු ගෙවීම වෙනුවෙන් ලබාගත් ලදුපත එකී පුද්ගලයා විසින් ඉදිරිපත් කිරීමෙන් අනතුරුවය.

2. පිළිගත් ආකෘති පත්‍රය මඟින් ඉදිරිපත් කරනු නොලබන හෝ මෙහි සඳහන් කර දක්වා ඇති කොන්දේසි හා අවශ්‍යතාවයන්ට තරයේ අනුකුල නොවන කිසිදු ලංසුවක් සලකා බලනු නොලැබේ.

3. ප්‍රසම්පාදන ලියවිලි වල යම්කිසි වෙනස් කිරීමක් හෝ මකා දැමීමක් කරනු ලැබුවේ නම්, ඒ සෑම ස්ථානයක් ම ලංසුකරු විසින් කෙටි අත්සන යොදා සහතික කල යුතුය.

4. සෑම ලංසුකරුවකු විසින්ම ආපසු ගෙවනු ලබන ලංසු සුරක්ෂණය බැංකු ඇපකරයක් ලබා දීමෙන් හෝ මුදලින් තැම්පත් කිරීම කල යුතු අතර බැංකු ඇපකරයක් ඉදිරිපත් කරන්නේ නම් බැංකු ඇපකරයේ මුල් පිටපත ද මුදලින් තැම්පත් කරන්නේ නම් දික්වැල්ල ප්‍රාදේශීය සභාවේ මුදල් තැන්පත් කර ලබාගත් ලදුපත **<u>ප්‍රසම්පාදන මුල් පිටපතේ අමුණා තිබීම</u>** අනිවාර්ය වේ. එසේ නොකර පසුව ඉදිරිපත් කරන ලදුපත් සඳහා තැන්පත් මුදල් ගෙවනු නොලැබේ.

5. සියළුම ප්‍රසම්පාදන ලියවිලි පිටපත් දෙකකින් යුතුව වෙන වෙනම කවර දෙකක **<u>මුල් පිටපත</u>** හා **<u>දෙවන පිටපත</u>** ලෙස සඳහන් කර මුද්‍රා තබා **<u>(මුද්‍රා තබන ලද කවර 2හි වම්පස උඩ කෙලවරෙහි ව්‍යාපෘතියෙහි නම ලිවිය යුතුය)</u>** එම මුද්‍රා තබන ලද කවර 2ක එකම කවරයක බහා නැවත මුද්‍රා තබා **<u>(මුද්‍රා තබන ලද කවරයෙහි වම්පස උඩ කෙලවරෙහි ව්‍යාපෘතියෙහි නම ලිවිය යුතුය)</u>** දික්වැල්ල ප්‍රාදේශීය සභාවේ සභාපති වෙත ලැබෙන සේ **<u>ලියාපදිංචි තැපෑලෙන්</u>** යොමු කල යුතුය. නොඑසේ නම් දික්වැල්ල ප්‍රාදේශීය සභාවේ ලංසු බහාලුම් පෙට්ටියට බහාලිය යුතුය. එය 2026.07.09 දින ප.ව. 2.00 ට පෙර ලැබෙන සේ දික්වැල්ල ප්‍රාදේශීය සභාව වෙත එවිය යුතුය.

6. කවර හෝ කොන්ත්‍රාත්කරුවකු ගිවිසුම අත්සන් කිරීමට අපොහොසත් වන්නේ නම් හෝ එසේ කිරීම ප්‍රතික්ෂේප කරන්නේ නම් සහ ලංසුව පිළිගත් බව සඳහන් ලිඛිත නිවේදනයක් ලැබීමෙන් දින 10 ක් තුළ අනුමත කරන ලද කාර්ය සාධන ඇප මුදල ඉදිරිපත් කිරීමට අපොහොසත් වන්නේ නම්, ලංසු සුරක්ෂණ මුදල සභාව සතු කරනු ලැබෙනවා ඇත. ලංසුකරු විසින් සඳහන් කර ඇති ලිපිනය වෙත ලියාපදිංචි තැපෑලෙන් යවනු ලැබ ඇත්නම් හෝ එකී ලිපිනය වෙත භාරදී ඇත්නම් හෝ එකී දැන්වීම එම ලංසුකරු වෙත ලැබී ඇති බවට සලකනු ලැබේ.

7. කොන්ත්‍රාත්තුව සඳහා අවශ්‍ය කාර්ය සාධන සුරක්ෂණයේ වටිනාකම කොන්ත්‍රාත්තුවේ වටිනාකමින් 5% හෝ තාක්ෂණික ඇගයීම් කමිටුව නිර්දේශ කරන ලද මුදල තෝරාගත් කොන්ත්‍රාත්කරු විසින් දික්වැල්ල ප්‍රාදේශීය සභාවේ තැම්පත් කිරීම හෝ ශ්‍රී ලංකා මහ බැංකුව විසින් පිළිගත් බැංකුවකින් ලබාගත් කාර්යසාධන සුරක්ෂණයක් ඉදිරිපත් කිරීම කල යුතුය. එමෙන්ම, කොන්ත්‍රාත් වටිනාකමින් 110% ක රක්ෂණ ඇපකරයක් තෝරාගත් කොන්ත්‍රාත්කරු විසින් ඉදිරිපත් කල යුතුය.

8. කොන්ත්‍රාත්කරු ලෙස තමා තෝරා ගතහොත් තමා විසින් ඇතුළත් විය යුතු ගිවිසුම් පිළිබඳව විස්තර සඳහන් කොන්ත්‍රාත් ගිවිසුම් ආකෘති පත්‍රය කොන්ත්‍රාත්කරු විසින් ප්‍රාදේශීය සභාව වෙතින් ලබාගෙන ඉතා සුපරීක්ෂාකාරීව අධ්‍යයනය කල යුතු අතර, අවශ්‍ය වේ නම් ප්‍රාදේශීය සභා කාර්යාලය වෙතින් ඒ පිළිබඳ පැහැදිලි කිරීම් ලබා ගත යුතුය.

9. කොන්ත්‍රාත්තුව අහිමි වූ කොන්ත්‍රාත්කරුවන්ගේ තැන්පත් මුදල් කොන්ත්‍රාත් ගිවිසුම අත්සන් කරනු ලැබීමෙන් අනතුරුව ආපසු ගෙවනු ලැබේ.

10. නිසි පරිදි දෙන ලද අවසරයකින් තොරව කිසිදු කොන්ත්‍රාත්තුවක් අනෙකෙකු වෙත පැවරීමට හෝ අතුරු බදු දීමට නොහැකිය.

11. කොන්ත්‍රාත්තුව පිරිනමන දින කොන්ත්‍රාත්කරු විසින් දික්වැල්ල ප්‍රාදේශීය සභාව සමඟ ගිවිසුමකට එළඹිය යුතුය.

12. **<u>පූර්ව ලංසු කැඳවීමේ රැස්වීම 2026.07.02 වන බ්‍රහස්පතින්දා දින පෙ.ව.10.00 ට</u>** දික්වැල්ල ප්‍රාදේශීය සභා කාර්යාලයේ දී පැවැත්වේ. එහිදී ලංසු කැඳවා ඇති කර්මාන්තවලට අදාළ තොරතුරු සම්බන්ධයෙන් විමසීම් කල හැකිය.

13. **<u>2026.07.09 වන දින ප.ව.2.00 ට දික්වැල්ල ප්‍රාදේශීය සභා කාර්යාලයේ දී</u>** ලංසු විවෘත කරනු ලබන අතර ප්‍රසම්පාදන කමිටු මණ්ඩලයේ තීරණය අවසාන තීරණය වේ.

රුවන් වික්‍රමආරච්චි,<br>
සභාපති,<br>
දික්වැල්ල ප්‍රාදේශීය සභාව